# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1842/17 - 2013 දෙසැම්බර් මස 27 වැනි සිකුරාදා - 2013.12.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : KOT/LND/ACQVI/01/01 (ඉඅ/3529).
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය : 4/5/2010/ඊ/291.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :*

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 242 කොටපොල (උතුර) ග්‍රාම නිලධාරි වසමේ කොටපොල ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද අවසාන ගම් පිඹුරු අංක 45හි අතිරේක අංක 87හි පත්‍ර 115හි කැබලි අංක 2294 දරන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.8094ක් වූ පහත සඳහන් ඉඩම් කැබැල්ලට මායිම්

**කැබලි අංක 2293 කුරුඳුවත්ත නමැති ඉඩම; මූල් හිමිකම් කියන්නා: කොටපොල කුරුඳුවත්ත පදිංචි ජගත් චන්දන අබේගුණවර්ධන**

උතුරට: කැබලි අංක 515 සහ 1766ද; නැගෙනහිරට: කැබලි අංක 1766ද; දකුණට: කැබලි අංක නොයෙදූ දොල සහ කැබලි අංක 515 ද; බස්නාහිරට: කැබලි අංක නොයෙදූ දොල සහ කැබලි අංක 515 ද වේ.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් 2014 පෙබරවාරි මස 11 වැනි දින පෙ. ව. 10.00 ට කොටපොල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2014 පෙබරවාරි මස 04 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු යි.

ගනේෂ අමරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
කොටපොල.

2013 දෙසැම්බර් මස 24 වැනි දින,
කොටපොල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

01 - 360

---

### ශුද්ධි පත්‍රය

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : KOT/LND/ACQVI/01/61.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය : 03J/81/E/256.

උක්ත ශීර්ෂය යටතේ අංක 695/17 හා 1992.01.03 දින දරන ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ මා විසින් පළ කරන ලද දැන්වීමෙහි සඳහන් හිමිකම් පරීක්ෂණය පැවැත්වෙන දිනය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලබනු බව මෙයින් දැනුම් දෙනු ලැබේ:-

| *ඉවත් කළ යුතු දිනය* | *සංශෝධිත දිනය* |
|---|---|
| 1992.03.27 | 2014.02.18 |

ගනේෂ අමරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
කොටපොල.

2013 දෙසැම්බර් මස 24 වැනි දින,
කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01 - 361